# කැලණිය අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2017

07 ශ්‍රේණිය | නර්තනය I, II | කාලය පැය 01 1/2

නම : ..................................................................................................

| | |
|---|---|
| ලිඛිත පරීක්ෂණය සඳහා ලකුණු | 50 |
| ප්‍රායෝගික පරීක්ෂණය සඳහා ලකුණු | 50 |
| | 100 |

❖ සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
❖ නිවැරදි පිළිතුර තෝරා ලකුණු කරන්න.

01. උඩරට නර්තන සම්ප්‍රදායේ පාද හුරු කර ගැනීම සඳහා කරනු ලබන සරඹ විශේෂය ................ නමින් හැඳින්වේ.
   1. ඉලංගම් සරඹ  2. පා සරඹ  3. ගොඩ සරඹ  4. දොඹින පද

02. "ගත්තකු ජිත්තම්, ගජිතකු ජිත්තම් තරිකිට ජිත් තරිකිට දොම්කිට තා" ... මෙය,
   1. දෙවන ගොඩ සරඹයට අයත් කස්තිරමයි  2. තුන්වන ගොඩ සරඹටයට අයත් කස්තිරමයි
   3. දෙවන පා සරඹයට අයත් හමාර පදයයි  4. හතරවන පා සරඹයට අයත් හමාර පදයයි

03. සුළු මැදුම් දෙතිතට අයත් මාත්‍රා සංඛ්‍යා ලියා දක්වන්නේ,
   1. 2 + 2 වශයෙනි  2. 2 + 3 වශයෙනි  3. 2 + 4 වශයෙනි
   4. 3 + 3 වශයෙනි

04. උඩරට නර්තන සම්ප්‍රදායේ වන්නමක කස්තිරමට පසු නටනු ලබන්නේ,
   1. හමාර පදයයි  2. අඩව්වයි  3. ඉරට්ටියයි  4. සීරුමාරුවයි

05. දෙතිතේ තාල රූපයට අනුව තාලම්පට වාදනය කරනු ලබන්නේ,
   1. තිත් , තිත් ලෙස ය  2. තෙයි තෙයි ලෙස ය
   3. තිත් තෙයි ලෙස ය  4. තෙයි තිත් ලෙස ය

06. දවුල ප්‍රධාන වාද්‍ය භාණ්ඩය ලෙස භාවිත කරනුයේ,
   1. උඩරට නර්තන සම්ප්‍රදායේ  2. පහතරට නර්තන සම්ප්‍රදායේ
   3. සබරගමු නර්තන සම්ප්‍රදායේ  4. ද්‍රවිඩ නර්තන සම්ප්‍රදායේ

07. විකල්ප වාද්‍ය භාණ්ඩයකි,
   1. පන්තේරුව  2. තාලම් පට  3. රබාන  4. ටින් වීණාව

08. කාන්තාවක් විසින් පමණක් නටනු ලබන ගැමි නැටුමකි,
   1. කුළු  2. තාලම්  3. රබන්  4. සවරන්

09. පිපුණු විශාල මලක් පිළිබඳ විස්තරයක් කියවෙන ගායන විශේෂයකි,
   1. අනෝතත්ත විල කවි  2. අත්තන මල් කවි
   3. තලමල වරුණ කවි  4. රුක් අත්තන කවි

10. රාමසාන් උත්සවය පවත්වනු ලබන්නේ,
   1. බෞද්ධ බැතිමතුන්  2. කතෝලික බැතිමතුන්
   3. හින්දු බැතිමතුන්  4. ඉස්ලාම් බැතිමතුන්

11. " අගේ වඩන මගෙ තාලම් හරඹ බලන්නේ............. " මෙම තාලම් කවිය ගයනු ලබන්නේ,

1. මාත්‍රා 2 තනි තිතට අනුවය
2. මාත්‍රා 3 තනි තිතට අනුවය
3. මාත්‍රා 4 තනි තිතට අනුවය
4. මාත්‍රා 2 + 3 දෙතිතට අනුවය

12. පා සරඹ නර්තනයේ දැකිය හැකි සුවිශේෂී ලක්ෂණයකි,

1. කටින් පද කියමින් තාලම්පට පමණක් වාදනය කිරීම
2. බෙර වාදනයට අනුව නර්තනය
3. පා සරඹ සමඟ කස්තිරමක් නැටීම
4. මූලික ඉරියව්වෙන් තොරව නර්තනයේ යෙදීම

13. හනුමා වන්නම නටනු ලබන්නේ,

1. මාත්‍රා 2 + 2 තනි තිතටය
2. මාත්‍රා 3 + 3 තනි තිතටය
3 මාත්‍රා 4 + 4 තනි තිතටය
4. මාත්‍රා 2 + 3 දෙතිතටය

14. " අණ කරන චන්නයෙන "......... මෙම කවි පදයේ ඉතිරි වචන සමූහය වන්නේ,

1. ලත් යුත් සිදත් කුමරු
2. කන්ථකය අසුගෙනෙන
3. ශබ්දත් වසත් සුරිඳු
4. එතැන තැන පසුව දූන

15. ʌ , / , __ , ∪ ආදී මෙම සංකේත අප භාවිත කරනුයේ

1. බෙර වාදනයේදී 2. රූප සටහන් ඇඳීමේදී 3. නර්තනයේදී 4. ප්‍රස්තාර කරණයේදී

16. දවුල භාවිත කරන ආගමික අවස්ථාවකි,

1. තේවා වාදනය 2. අණ බෙර වාදනය 3. මල බෙර වාදනය 4. රණ බෙර වාදනය

17. විකල්ප සුසිර වාද්‍ය භාණ්ඩයකි,

1. කොම්බුව 2. හොරණෑව 3. හක් ගෙඩිය 4. පොල්කොළ නලාව

18. උඩරට වන්නම් රචනා කරන ලද යුගය ලෙස සැලකෙන්නේ,

1. අනුරාධපුර යුගයයි 2. පොළොන්නරු යුගයයි 3. මහනුවර යුගයයි 4. කොළඹ යුගයයි

19. උඩරට වන්නම් මුලින්ම ගායනා කරන ලද්දේ,

1. දේවාලවල 2. කවිකාර මඩුවේය 3. මඟුල් උයනේය 4. පෙරහැරවලය

20. උඩරට නර්තන සම්ප්‍රදායේ ශිල්පීය ප්‍රාගුණ්‍ය එළි දක්වන අවස්ථාවකි,

1. මඩු බැසීම 2. හළං වැඩීම 3. ගෙජ්ජි බැඳීම 4. හිස වෙස් පැළඳවීම

## II කොටස

පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 3කට පිළිතුරු සපයන්න.

01. 1. වදුරෙකුගේ ඉරියව් හා ක්‍රියා පිළිබඳ .......................... වන්නමෙන් කියවේ

2. .......................... වන්නමෙන් කියවෙනුයේ සිදුහත් කුමරුගේ අභිනිෂ්ක්‍රමණය පිළිබඳවයි

3. ගැටබෙරය ................. වාද්‍ය භාණ්ඩයක් වන අතර දඬු බෙරය විකල්ප වාද්‍ය භාණ්ඩයකි

4. රාමසාන් උපවාස කාලය .................................... නමින් හැඳින්වේ

5. ...................... තේමා කර ගනිමින් නර්තන නිර්මාණය කිරීමේදී සුළඟ හෙණහඬ විදුලි කෙටීම වැනි අවස්ථා යොදා ගත හැකිය. (ලකුණු 10)

02. 1. දෙතිතට අයත් බෙර පදයක් ලියන්න (ල 2)

2. අදාල තිත් රූපයට අනුව එම බෙරපදය ප්‍රස්තාර ගත කරන්න (ල 3)

3. තුරගා වන්නමට නටනු ලබන කස්තිරමේ මුල් පදය ප්‍රස්තාර ගත කරන්න (ල 5)

03. 1. ඔබ උගත් සම්ප්‍රදායික වාද්‍ය භාණ්ඩයක් නම් කරන්න. (ල 1)

2. එම වාද්‍ය භාණ්ඩය සකස් කිරීමට යොදා ගන්නා අමු ද්‍රව්‍ය 02ක් ලියන්න (ල 4)

3. එම වාද්‍ය භාණ්ඩයේ රූප සටහනක් ඇද කොටස් නම් කරන්න (ල 5)

04. 1. ඔබ පංති කාමරයේ නර්තන විෂය හැදෑරීමේදී ඉගෙන ගත් සැරසිලි අංගයක් නම් කරන්න (ල 1)

2. එම සැරසිලි අංගය සකස් කිරීම සඳහා පරිසරයෙන් ලබාගත හැකි අමුද්‍රව්‍ය 02ක් ලියන්න (ල 4)

3. එම සැරසිලි අංගය භාවිත කරන අවස්ථාවක දී එය සරසා ඇති ආකාරය කෙටියෙන් විස්තර කරන්න. (ල 5)